CA

# ගිණුම්කරණය හා ඒහි අවශ්‍යතාවය

01

**01.** ගිණුම්කරණයේ මූලික අරමුණ වන්නේ,

I. සියළුම ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කිරීමයි.
II. මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීම , වර්ග කිරීම හා සාරාංශ කිරීමයි.
III. මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට තීරණ ගැනීම සඳහා අවැසි තොරතුරු සම්පාදනය කිරීමයි.
IV. මූල්‍ය ප්‍රකාශ තුළින් සංවිධානයක අවසන් ප්‍රතිඵල ලබා දීමයි.
V. පිරිවැය කළමනාකරුවන්ට විශ්ලේෂණය කරන ලද විස්තරාත්මක තොරතුරු සැපයීමයි

( …………………… )

**02.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් කුමන ප්‍රකාශනය '' ගිණුම්කරණයේ මූලික පරමාර්ථය " යන්න වඩාත් හොඳින් විස්තර කරනු ලබයි ද ?

I. කළමනාකරණය තීරණ ගැනීමේ අවශ්‍යතාවය සපුරා ගනු වස් මූල්‍ය පිරිවැය කළමනාහා කළමනාකරණ තොරතුරු සන්නිවේදනය කිරීම .
II. මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ගේ තීරණ ගැනීමේ අවශ්‍යතාවය සපුරා ගනු වස් ගිණුම්කරණ තොරතුරු සන්නිවේදනය කිරීම .
III. මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම සඳහා සියලුම ව්‍යාපාරික ගනුදෙනු ජර්නල් හා ලෙජර් ගිණුම් වල වාර්තා කිරීම.
IV. ව්‍යාපාරයක මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම හා අර්ථකථනය කිරීම.
V. කළමනාකරණය තීරණය උදෙසා සියලුම ව්‍යාපාරික තොරතුරු සන්නිවේදනය කිරීම

( …………………… )

**03.** පහත දැක්වෙන සාධක අතුරින් කුමන සාධකය "නෛතික පරිසර සාධකය " සඳහා වඩාත් උචිත වේ ද ?

I. රටේ සේවකයන්ගේ වැටුප් තලයන් ඉහළ යාම.
II. 2020.01.01 දින සිට නව සංකල්පනාත්මක රාමුව හඳුන්වා දීම.
III. 1987 අංක 17 දරණ සමාගම් පනත වෙනුවට 2007 අංක 7 දරන සමාගම් පනත හඳුන්වා දීම.
IV. 2012 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිත හා පදනම්ව නව ගිණුම්කරණ ප්‍රමිත හඳුන්වාදීම
V. අවසාන ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ පැවති තොග මිල කිරීමේ ප්‍රතිපත්තිය, ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය ට වෙනස් කිරීම

( …………………… )

**04.** පහත දැක්වෙන කාර්යයන් අතුරින් කුමන කාර්යය සමාජීය සංසිද්ධියක් ලෙස ගිණුම්කරණය විසින් ඉටු නොකරන්නේ ද ?

I. ආර්ථික සංවර්ධනය තුලින් පුද්ගලයින්ගේ ජීවන තත්ත්වය උසස් කරලීම .
II. පිරිවැය හා කළමනාකරණ ගිණුම්කරණය සඳහා මූලික තොරතුරු ලබාදීම .
III. ආර්ථිකය තුළ රැකියා අවස්ථා ජනිත කිරීම.
IV. සම්පත් පාලනය සඳහා වූ වගවීම සඳහා මග පෙන්වීම .
V. අනාගතය සඳහා සම්පත් ආරක්ෂා කිරීම.

( …………………… )

**05.** පහත සඳහන් කරුණු අතුරින් ව්‍යාපාරයකට ගිණුම් තැබීමේ අවශ්‍යතාවයක් පැන නැගීමට බලපාන සුදුසුම හේතු කාරණා වන්නේ ,

I. තීරණ ගැනීමේ අවශ්‍යතාවය සඳහා අදාළ තොරතුරු කළමනාකරණයට සංනිවේදනය කිරීම .
II. විශාල ගනුදෙනු සංඛ්‍යාවක් මතකයේ තබා ගැනීමට අපහසුවීම .
III. ව්‍යාපාර මූල්‍ය කාර්යසාධනය ඇගයීමට.



Suranga Sampath "''''''' ☎ ….. 071 6 83 25 73

IV. ව්‍යාපාරය සීමිත සම්පත් නිසි පරිදි පාලනය කරමින් ව්‍යාපාරය නිශ්චිත අරමුණු කරා ළඟා වීමට .
V. 2007 අංක 7 දරන සමාගම් පනතේ නීතිමය අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමට.

( ........................ )

**06.** ගිනුම්කරන පරිසර සාධකය සම්බන්ධවයෙන් පහත දැක්වෙන කුමන ප්‍රකාශනය නිවැරදි වන්නේ ද?

I. ආර්ථික පරිසර සාධක වෙනස් වීමේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රියා ව්‍යාපාරික කටයුතු වලට සිදු වූ බලපෑම මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළි දරව් කිරදරව් කිරීම අවශ්‍ය නොවේ.
II. වෙළඳපොල ආර්ථික ක්‍රමය හඳුන්වා දීම ආර්ථික පරිසර සාධකයක් ලෙස හඳුනාගත නොහැක .
III. ආර්ථික පරිසර සාධකය ජනිත වන්නේ ද , වෙනස් වන්නේ ද , දේශපාලන පරිසර සාධක වෙනස් වීම හේතුකොටගෙනය.
IV. සමාජ හා සංස්කෘතික සාධක යනු කුඩා පරිමාණ ව්‍යාපාර සඳහා අවම බලපෑමක් ඇති කරනු ලබයි.
V. ආර්ථිකය තුළ ඇති ව්‍යාපාරයන්හි ප්‍රධානම සාධකය දේශපාලන පරිසරය නොවේ.

( ........................ )

**07.** පහත දැක්වෙන පරිසර සාධක අතුරින් ගිණුම්කරණයේ නව ප්‍රවණතාවයක් නො වන්නේ කුමක්ද ?

I. උද්ධමනයේ ප්‍රතිඵලයක් ලෙස මුදලේ අගය ඇතිවන වෙනස්වීම් සැලකිල්ලට භාජනය කරමින් ගිණුම් තැබීමේ නව ක්‍රමයක් ලෙස උද්ධමනය ගිණුම්කරණ හඳුන්වා දිය හැක.
II. ගිණුම්කරණ තොරතුරු සැසඳිය හැකි බව වැඩි දියුණු කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූලධර්ම වල ඒකාකාරීත්වය ආරක්ෂා කිරීම ගිණුම්කරණ හඳුන්වාදීම.
III. සමාජීය වගකීම් වෙනුවෙන් ඇති ගිණුම්කරණයේ කාර්ය කාර්යභාරය වූ ව්‍යාපාරයක වගවීම යන්න ඇගයීම සඳහා සත්‍ය වගකීම් ගිණුම්කරණය හඳුන්වාදීම.
IV. ව්‍යාපාරයක ක්‍රියාකාරකම් තුළින් පරිසරයට සිදුවන බලපෑම් හා ප්‍රතිඵල හෙළිදරව් කිරීම් සඳහා පරිසර ගිණුම්කරණය හඳුන්වාදීම්

( ........................ )

**08.** පහත සඳහන් අගයන්ට අදාලව මූල ගිණුම් ගිණුම්කරණය සහ කළ කළමනා කළමනාකරණ ගිණුම්කරණයය අතර වෙනස දක්වන්න.

| | අංගය | මූල්‍ය ගිනුම්කරනය | කලමනාකරන ගිණුම්කරනය |
|---|---|---|---|
| 01. | තොර තොරතුරු භාවිතා කරන්නන් | ........................................ | ........................................ |
| 02. | තොර තොරතුරු වාර්තා කිරීමේ වාර ගණන | ........................................ | ........................................ |

**09.** පහත දැක්වෙන කුමන ප්‍රකාශනය ආයතනයක මූල්‍ය ගණකාධිකරණය කාර්ය කාර්යභාරය වඩාත් හොඳින් විස්තර කරනු ලබයි ද ?

I. ඒ ආයතනයක ගනුදෙනු ගිණුම් පොත්වල වාර්තාකරයි.
II. ඒය ආයතනයක ගනුදෙනු මූල්‍ය තොරතුරු වලට පරිවර්තනය කරයි.
III. ආයතනයක වාර්ෂික විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබයි .
IV. ආයතනයක සැලසුම් කිරීම සහ පාලනයය සඳහා ද කලළමනාකරුවන්ට තොරතුරු සපයයි .
V. ආයතනය පිළිබඳ ඇල්මක් දක්වන බාහිර පාර්ශවයන්ට සහ කළමනා කළමනාකරුවන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සපයයි.

( ........................ )

**10.** . අදාල තීරුවේ ලකුණක් යොදමින් පහත ප්‍රකාශය සත්‍ය අසත්‍ය බව දක්වන්න.

| | ප්‍රකාශය | සත්‍ය | අසත්‍ය |
|---|---|---|---|



Suranga Sampath ”””” ☎ ..... 071 6 83 25 73

| | | | |
|---|---|---|---|
| 01. | කළමනාකරණය ගිණුම්කරණයේ මූලික අරමුණ වන්නේ ව්‍යාපාරය පිළිබඳ ඇල්මක් දක්වන අභ්‍යන්තර පාර්ශ්වයන්ට ආයතනයක් පිළිබඳ තීරණ ගැනීමට තොරතුරු සැපයීමයි. | | |
| 02. | ආයතනයක මුදලින් මැනිය හැකි ගනුදෙනු පමණක් ගිණුම් පොත්වල සටහන් කෙරේ. | | |
| 03. | ආයතනයක තොරතුරු භාවිතා කරන භාවිත පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා විශේෂිත පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන සපයනු ලැබේ. | | |
| 04. | ආර්ථික තීරණ ගැනීමේ සමාජය අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් ගිණුම්කරණ විකාශනය වී ඇත. | | |

**11.** මූල්‍ය ගිණුම්කරණය සහ කළමනා කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස්කම් පහත කරුණු මත සඳහන් කරන්න .

| **A.** | කරුණ | මූල්‍ය ගිණුම්කරනය | කලමනාකරන ගිණුම්කරණය |
|---|---|---|---|
| **B.** | වාර්තා භාවිතා කරන පාර්ශවය | | |
| **C.** | පිළියෙළ කරන වාර ගණන | | |
| **D.** | නෛතික අවශ්‍යතාවය | | |
| **E.** | වාර්තා කරන තොරතුරු වල ස්වභාවය | | |

**12.** පහත දැක්වෙන කුමන ප්‍රකාශය ආයතනයක මූල්‍ය ගිණුම්කරණයේ මූලික කාර්යභාරය සම්බන්ධයෙන් නිවැරදි වේ ද ?

I. එය ආයතනයක ගනු ගනුදෙනු මූල්‍ය පදනම් මත ගිණුම් පොත්වල වාර්තාකරකරයි .

II. ඒ ආයතනයේ කළමනාකරුවන්ගේ භාවිතය සඳහා විශේෂිත පරමාර්ථ මූල්‍ය වාර්තා පිළියෙල කරයි .

III. ආයතනයක් පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශ්වයන්ගේ භාවිතය සඳහා පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරයි.

IV. ආයතනයක අයිතිකරුවන්ට තීරණ ගැනීම සඳහා අතීත හා අනාගත තොරතුරු සපයයි.

V. ආයතනයක වාර්ෂික විගණනයට අවශ්‍ය මූල්‍ය තොරතුරු සපයයි.

**13.** ආයතනයක කළමනාකරණ ගිණුම්කරණ කාර්යභාරයට අදාල ව පහත ප්‍රකාශ සත්‍ය අසත්‍ය බව සඳහන් කරන්න.

| | ප්‍රකාශය | සත්‍යය / අසත්‍යය |
|---|---|---|
| **A.** | ඒය ආයතනයක කළමනාකරුවන්ට තීරණය ගැනීම සඳහා තොරතුරු සපයයි | |
| **B.** | එය ආයතනය පිළිබඳ අතීත සහ අනාගත තොරතුරු සපයයි | |
| **C.** | ගිණුම්කරණ ප්‍රමිත මගින් නියම කරන ලද තොරතුරු සපයයි | |
| **D.** | ඒය ආයතනයක් පිළිබඳ ඇල්මක් දක්වන සියලු පාර්ශ්වයන්ට ඔවුන්ගේ ඉල්ලීම මත තොරතුරු සපයයි | |

**14.** පහත කාර්යයක් කළමනාකරණ ගිණුම්කරණය විෂය පතය තුලට ඇතුලත් වන්නේ ද යන්න සඳහන් කරන්න.

| | කාර්යය | ඔව් / නැත |
|---|---|---|
| **A.** | භාණ්ඩ මිල කිරීම් සඳහා පිරිවැය තොරතුරු සැපයීම . | |
| **B.** | පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම | |
| **C.** | දිගුකාලීන ආයෝජන ව්‍යාපෘති ඇගයීම | |
| **D.** | ගිණුම්කරණ අනුපාත මත ආයතනයක ලාභදායිත්වය විශ්ලේෂණය කිරීම | |



**Suranga Sampath "''''''" ☎ ..... 071 6 83 25 73**

**15.** පහත සඳහන් දෑ ආයතනයක පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශනවල උපාංග ලෙස සලකණු ලබයි ද , යන්න සඳහන් කරන්න.

| | | |
|---|---|---|
| **A.** | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | ඔව් / නැත |
| **B.** | මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් | |
| **C.** | අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | |
| **D.** | හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය | |

**16.** ව්‍යාපාර ගනුදෙනු වාර්තා කිරීම , වර්ග කිරීම , මූලික සාරාංශ කිරීම හා සන්නිවේදනය ,

I. පොත් තැබීමයි
II. ගිණුම්කරණයයි.
III. ගිණුම්කරණයේ ප්‍රාථමික අවස්ථාවයි
IV. පොත් තැබීමේ ප්‍රාථමික අවස්ථාවයි.
V. ඉහත කිසිවක් නොවේ

( ......................... )

**17.** සීමිත පොදු සමාගමක ගිණුම්කරණ තොරතුරු ලබා දීමේදී වගකීම පැවරෙන්නේ ,

I. අධ්‍යක්ෂ මණ්ඩලයටය
II. කොටස් හිමියන්ටය
III. ගණකාධිකාරි වරයාටය
IV. විගණකවරුන් ටය
V. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය

( ......................... )

**18.** පහත ඒවායින් ව්‍යාපාරයක දුර්වලතාවයක් නොවන්නේ,

I. ගනුදෙනු නිසි පරිදි පොත් වල වාර්තා නොකිරීම.
II. වෙලාවට සේවකයන්ට වැටුප් නොගෙවීම
III. ණයට භාණ්ඩ විකිණීම
IV. බැංකුවලට ණය ආපසු නොගෙවීම
V. සැපයුම් කරුවන්ට වෙලාවට මුදල් නොගෙවීම

( ......................... )

**19.** ගිණුම්කරණ විඥාපන ලබාදීමට සහය වන්නේ ,

I. අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය .
II. ගිනුම් අංශයේ කාර්ය මණ්ඩලය
III. ගණකාධිකාරි වරයා සහ පොත් තබන්නා
IV. විසණක වරයා
V. ඉහත (1) හා ( 11 )

( ......................... )

**20.** ව්‍යාපාර ආයතනයක් සම්බන්ධ වූ පසුගිය තොරතුරු අතුරෙන් කුමන තොරතුරුට වෙළඳ ණයහිමියන් ඇල්මක් දක්වයි ද ?

I. වාර්ෂික ලාභාංශ
II. වර්ෂය සඳහා ලාභය
III. නියමිත කාලයේ දී ණය ගෙවීමේ හැකියාව
IV. ව්‍යාපාර ආයතන ප්‍රතිසංවිධානය කිරීමේ හැකියාව
V. ප්‍රත්‍යාගණන අතිරික්තය.

( ......................... )


**Suranga Sampath “”””** ☎ **..... 071 6 83 25 73**

**21.** ගිණුම්කරණ පරිසරය පිළිබඳ අවධානය යොමු කළ යුත්තේ,

- **I.** ගිණුම්කණුම්කරණයේ වෙනස්කම් ගිණුම්කරණ පරිසරය බලපාන නිසාය.
- **II.** ගිණුම්කරණය ක්‍රියාත්මක වන්නේ පරිසරය තුළ වන නිසාය .
- **III.** පරිසරය සුරැකීම නීතිමය අවශ්‍යතාවයක් වන නිසාය .
- **IV.** පරිසරය වෙනස්කම් ගිණුම්කරණයට බලපාන නිසාය.
- **V.** පරිසරය වෙනස් වුවද ගිණුම්කරණය වෙනස් නොවිය යුතු නිසාය.

( ........................ )

**22.** 2007 අංක 7 දරණ සමාගම් පනත විදීම තුළින් ගිණුම්කරණයට බලපෑමයි ඇතිවිය. මේ නිසා පෙන්නුම් කරන්නේ ,

- **I.** නෛතික පරිසරය ගිණුම්කරණයට ඇති කරන බලපෑම්
- **II.** ආර්ථික පරිසරය ගිණුම්කරණයට ඇති කළ බලපෑම
- **III.** වෘත්තීය හා ශිල්පීය පරිසරය ගිණුම්කරණයට අතිකළ බලපෑමයි.
- **IV.** දේශපාලන පරිසරය ගිණුම්කරණයට එකල බලපෑමයි
- **V.** තාක්ෂණික පරිසරය ගිණුම්කරණයට ඇති කළ බලපෑම

( ........................ )

**23.** ශ්‍රී ලංකාව වරලත් ගණකාධිකාරී ආයතනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සංශෝධනය කිරීම හා නව ප්‍රමිත හඳුන්වා දීම යනාදිය ගිණුම්කරණයට සිදු වන බ වන බලපෑම් වේ . ඒවැනි බලපෑම් හඳුන්වන්නේ ,

- **I.** තාක්ෂණික පරිසරයේ බලපෑම් ලෙසය.
- **II.** සමාජ හා සංස්කෘතික පරිසරයේ බලපෑම ලෙසය.
- **III.** ආර්ථික පරිසරයේ බලපෑම් ලෙසය.
- **IV.** නෛනතික පරිසරයේ බලපෑම් ලෙසය
- **V.** ශිල්පීය හා වෘත්තිය පරිසරයේ බලපෑම ලෙසය.

( ........................ )

**24.** වත්කමක් වීමට අත්‍යවශ්‍ය ගුණ ගුණාංගයක් වන්නේ ,

- I. ව්‍යාපාරයට නෛතික හිමිකමක් පැවතිය යුතුය.
- II. භෞතික පැවැත්මක් තිබිය යුතුය
- III. ව්‍යාපාරය පාලනයට නතුව පැවතිය යුතුය
- IV. හිමිකාරත්වය ට අයිති විය යුතුය
- V. ක්ෂය වෙන්කිරීමෙන් පසු සුන්බුන් අගයක් පැවතිය යුතුයි.

( ........................ )

**25.** “ තොරතුරු පද්ධතියක් ලෙස ගිණුම්කරණය වැදගත් කාර්ය කාර්යභාරයක් ඉටු කරයි “ මෙම ප්‍රකාශය පැහැදිලිව දැක්වෙන ප්‍රකාශය තෝරන්න ‘

- I. ගිණුම්කරණයෙන් විවිධ මූල්‍යමය තොරතුරු සපයන අතර එම තොරතුරු විවිධ පාර්ශ්වයන් විසින් ආර්ථික තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනයට ගනී.
- II. ගිණුම්කරණය තුළින් මුදලින් මැනිය හැකි තොරතුරු සපයයි.
- III. තොරතුරු සැකසීම තොරතුහා තොරතුරු සන්නිවේදනය කිරීමයි.
- IV. බදු වාර්තා සැකසීමට තොරතුරු සපයයි.
- V. ඉහත කිසිවක් නොවේ

**26.** ‘’ මූල්‍ය වාර්තාකරණය සිදු කරනු ලබන්නේ විශාල ලැයිස්තුගත සමාගම් මගින් පමණි ‘’ අශ්‍ය වන්නේ මෙම ප්‍රකාශය නිවැරදි දැයි හඳුනාගන්න

01. ඔව්
02. නැත

( ........................ )

**27.** පහත දැක්වෙන ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න හඳුනා ගන්න.

- I. නෛතික අවශ්‍යතාවයන්ට අනුගතව සකස් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන කොටස් හිමියන්ට ලැබේ.
- II. සමාගම් ගිණුම් , සේවකයන් හට නිරන්තරයෙන් ලැබෙනු ඇත.
- III. සීමිත සමාගමක ලාභය මත අය වන බදු වටිනාකම තක්සේරු කිරීම සඳහා බදු අධිකාරීන් වෙත විස්තරාත්මක මූල්‍ය ප්‍රකාශන ලැබෙනු ඇත.

IV. මූල්‍ය ආයතනවලට අයිරා පහසුකම් හෝ වෙනත් මූල්‍ය පහසුකම් සම්පාදනය කිරීමේ දී ප්‍රසිද්ධ කරනු ලබන මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත වන තොරතුරුවලට අමතරව වෙනත් තොරතුරු අවශ්‍ය වනු ඇත.

**28.** සාංගමික යහපාලනය යනු කුමක්ද ?

....................................................................................................................................................

**29.** සංවිධානමය යහ යහපාලනය යනු කුමක්ද ?

....................................................................................................................................................

**30.** අධ්‍යක්ෂකවරුන්ගේ නෛතිකව වගකීම් කවරේද ?

....................................................................................................................................................

**31.** මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම කවුරුන් සතු වේ ද ?

....................................................................................................................................................

**32.** 2007 අංක 7 දරන සමාගම් පනත සමාගම් මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ බවක් පෙන්නුම් කරන අයුරින් පිළියෙල කළ යුතු වේ. මෙය ලඟාකර ගැනීම සඳහා කටයුතු කළ යුත්තේ කෙසේද ?

....................................................................................................................................................

**33.** ව්‍යාපාරයක වෘත්තීය ගණකාධිකාරිවරයෙකුගේ භූමිකාව කෙටියෙන් විස්තර කරන්න .

....................................................................................................................................................

**34.** වෘත්තීය ගණකාධිකාරිවරයෙකුගේ වගකීමේ සීමාව පැහැදිලි කරන්න.

....................................................................................................................................................

**35.** වරලත් ගණකාධිකාරී ආයතනයේ සියලුම සාමාජිකයන් විසින් අනිවාර්යෙන් අනුගමනය කළ යුතු මූලධර්ම මොනවාද ?

....................................................................................................................................................

**36.** ව්‍යාපාරයක අභ්‍යන්තර වාර්තාකරණය යනු කුමක්ද ?

....................................................................................................................................................

**37.** කළමනාකරුවන් සඳහා ප්‍රයෝජනවත් වන්නේ පහත් සඳහන් ඒවා අතුරෙන් කුමන ප්‍රකාශනය ද?

I. පසුගිය මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන
II. පසුගිය වර්ෂ 5 සඳහා බදු වාර්තා.
III. එළඹෙන මූල්‍ය වර්ෂය සඳහා අයවැයන්
IV. පසුගිය වර්ෂය සඳහා වර්ෂය සඳහා බැංකු ප්‍රකාශන

**38.** මූල්‍ය ප්‍රකාශන භාවිතා කරමින් ගනු ලබන ආර්ථික තීරණ වර්ගවල පහත ඒවා ද ඇතුළත් වේ.

I. ස්කන්ධ ආයෝජන මිලදී ගැනීම් පවත්වා ගැනීම සහ විකිණීම සම්බන්ධ තීරණ .
II. කළමනාකාරීත්වයේ භාරකාරත්වයේ සහ ගිණුම් කටයුතු භාවය පිළිබඳ තක්සේරුව .
III. සේවකයිනයින්ට ගෙවීම් සඳහා ව්‍යවසායෙහි හැකියාව පිළිබඳ තක්සේරුව.
IV. ව්‍යවසාය වෙත ආරක්ෂණ ආකාරයෙන් අයට දී ඇති ප්‍රමාණය පිළිබඳ තක්සේරුව.
V. බදු ප්‍රතිපත්ති පිළිබඳ තීරණයන්.
VI. බෙදිය හැකි ලාභ සහ ලාභාංශ පිළිබඳ තීරණයන්
VII. ජාතික ආදායම් සංඛ්‍යාතයන් හි ඇතුළත් කිරීම.
VIII. ව්‍යවසායකයන් හි ක්‍රියාකාරකම් පිළිබඳව රෙගුලාසි.

ඉහත ලැයිස්තුවේ ඒක් ඒක් තීරණය කවර වර්ගයේ මූල්‍ය ප්‍රකාශ පරිශීලකයෙකු විසින් ගනු ඇත්දැයි හඳුනා ගන්න



**Suranga Sampath** "''''''" ☎ ..... **071 6 83 25 73**